# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/NSLE/103/DMD/09/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025-12-20

**අයවැය චක්‍රලේඛ අංක 08/2025(i)**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්

**ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන**

අයහපත් කාලගුණික තත්ත්වය නිසා පැන නැගුණු හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව බිඳ වැටී ඇති ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා, 2025-12-05 දිනැති අයවැය චක්‍රලේඛ අංක 08/2025 මඟින් යෝජිත සවිබල ගැන්වීමේ වැඩසටහන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට නව එකතු කිරීම් පැහැදිලි කිරීම් හා සංශෝධන ඇතුළත් කිරීමට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ඒ අනුව, අයවැය චක්‍රලේඛ අංක 08/2025 හි සඳහන් වගුවේ අනු අංක 3, 5, 6, 7, 9, 11, 12 සහ 14 පහත පරිදි සංශෝධනය කෙරේ.

| 08/2025 චක්‍රලේඛයේ වගුවේ අනු අංකය | යෝජිත සහනය | දීමනාව |
|---|---|---|
| 3 | නායයෑම් හා ගංවතුර හේතුවෙන් තම පදිංචි නිවස අහිමි වූ හෝ නිවස පූර්ණ ලෙස හානි වීම හේතුවෙන් තම ස්ථිර ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව නිරත වීමට නොහැකි පවුල් වෙත **උපරිමය මාස 03 ක** කාලයක් සඳහා ගෙවනු ලබන මාසික දීමනාව. | සාමාජිකයන් ගණන 02 හෝ ඊට අඩු පවුලක් සඳහා රු. 25,000/- ක දීමනාව<br>සාමාජිකයන් ගණන 02ට වැඩි පවුලක් සඳහා රු. 50,000/- ක දීමනාව |
| 5 | ආපදාවෙන් බලපෑමට ලක් වූ **වී, ධාන්‍ය, බඩ ඉරිඟු, රටකජු සහ ක්ෂේත්‍ර භෝග** වගාබිම්වල වගා හානි හෝ නැවත වගා කිරීම සඳහා එකවරක් පමණක් ගෙවනු ලබන දීමනාව | හෙක්ටයාර එකකට රු. 150,000/- |
| 6 | ආපදාවෙන් බලපෑමට ලක් වූ **එළවලු, මිරිස්, ළූණු යන භෝග සහ කෙසෙල්, පැපොල් හා අන්නාසි යන පලතුරු** වගාබිම්වල වගා හානි හෝ නැවත වගා කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව. | හෙක්ටයාරයකට රු. 200,000/- |

| 08/2025 චක්‍රලේඛයේ වගුවේ අනු අංකය | යෝජිත සහනය | | දීමනාව |
|---|---|---|---|
| 7 | ආපදාවෙන් බලපෑමට ලක් වූ සත්ත්ව පාලන ගොවිපළවල්වල මියගිය සතුන් ගණන පදනම් කරගෙන ගෙවනු ලබන දීමනාව (ලියාපදිංචි ගොවිපල හිමියන් වෙත පමණි). | | |
| | 7.1 (අ) | ගව පාලනය - දෙමුහුම් | මියගිය එක් සතෙකු සඳහා රු. 200,000/- බැගින් උපරිමය සතුන් 10 ක් දක්වා (උපරිම ගෙවීම රු. 2,000,000/-) |
| | 7.1 (ආ) | ගව පාලනය - දේශීය | මියගිය එක් සතෙකු සඳහා රු. 50,000/- බැගින් උපරිමය සතුන් 20 ක් දක්වා (උපරිම ගෙවීම රු. 1,000,000/-) |
| | *7.1 (අ) සහ 7.1 (ආ) යටතේ සඳහන් සතුන් කාණ්ඩ දෙකම සිටින ගොවිපලක් සඳහා උපරිම ගෙවීම රු. 2,000,000/- කි.* | | |
| | 7.2 | සූකර පාලනය | මියගිය එක් සතෙකු සඳහා රු. 20,000/- බැගින් උපරිමය සතුන් 20 ක් දක්වා (උපරිම ගෙවීම රු. 400,000/-) |
| | 7.3 | එළු/ බැටළු පාලනය | මියගිය එක් සතෙකු සඳහා රු. 20,000/- බැගින් උපරිමය සතුන් 20 ක් දක්වා (උපරිම ගෙවීම රු. 400,000/-) |
| | 7.4 (අ) | කුකුළු පාලනය - ලේයර් | මියගිය එක් සතෙකු සඳහා රු. 500/- බැගින් උපරිම ගෙවීම රු. 1,000,000/- දක්වා |
| | 7.4 (ආ) | කුකුළු පාලනය - බ්‍රොයිලර් | මියගිය එක් සතෙකු සඳහා රු. 250/- බැගින් උපරිම ගෙවීම රු. 1,000,000/- දක්වා |
| | *7.4 (අ), 7.4 (ආ) යටතේ සඳහන් සතුන් කාණ්ඩ දෙකම සිටින ගොවිපලක් සඳහා උපරිම ගෙවීම රු. 1,000,000/- කි.* | | |
| | 7.5 | ගෙවතු ආශ්‍රිත කුකුළු පාලනය | ඒකකයකට රු. 10,000/- ක එක්වරක් පමණක් ගෙවන දීමනාව |
| 9 | ආපදාවෙන් හානි වූ ධීවර කර්මාන්තය යළි නගා සිටුවීම | | |
| | 9.1 | ආපදාවෙන් හානි වූ කරදිය ධීවර කර්මාන්තයේ යොදවා ඇති බෝට්ටු සහ දැල් සඳහා සහන ලබා දීම | |
| | | පූර්ණ ලෙස හානි වූ ධීවර බෝට්ටු | හානි වූ ධීවර බෝට්ටුව සඳහා ලැබෙන රක්ෂණ වන්දි මුදල සී/ස සීනෝර් පදනම වෙත ගෙවීමට යටත්ව නව බෝට්ටුවක් එම පදනම මඟින් ලබා දීම |
| | | අර්ධ ලෙස හානි වූ ධීවර බෝට්ටු | සී/ස සීනෝර් පදනම මඟින් අලුත්වැඩියා කර දීම |

| 08/2025 චක්‍රලේඛයේ වගුවේ අනු අංකය | | යෝජිත සහනය | දීමනාව |
|---|---|---|---|
| | | ආපදාවෙන් දැල් අහිමි වූ ධීවරයන්ට නෝර්ත් සී ලිමිටඩ් මඟින් දැල් මිලදී ගැනීමට එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව. | එක් ධීවරයෙක්ට රු. 100,000/-ක් වටිනා කූපන් පතක් |
| | 9.2 | ආපදාවෙන් හානි වූ වැව් ආශ්‍රිත මිරිදිය ධීවර කර්මාන්තයේ යොදවා ඇති කුඩා ඔරු හා දැල් සඳහා වන දීමනාව | |
| | | පූර්ණ ලෙස හානි වූ ඔරු | එක් ධීවරයෙක් සඳහා රු.100,000/-ක එක්වරක් පමණක් ගෙවන දීමනාව |
| | | අර්ධ ලෙස හානි වූ ඔරු | සී/ස සීනෝර් පදනම මඟින් අලුත්වැඩියා කර දීම |
| | | හානි වූ දැල් | හානි වූ එක් දැලක් සඳහා රු. 15,000/- ක් බැගින් එක් ධීවරයෙක්ට උපරිම දැල් 5ක් සඳහා ගෙවන දීමනාව (උපරිම රු. 75,000/- කි) |
| 11 | ආපදා බලපෑම හේතුවෙන් හානි වී ඇති ස්ථිර ව්‍යාපාරික ගොඩනැඟිලි සඳහා ව්‍යාපාර ගොඩනැඟිලි හිමියෙකුට නැවත තම ව්‍යාපාරික ස්ථානය යථාවත් කර ගැනීම සඳහා දෙනු ලබන දීමනාව. | | |
| | 11.1 | හානි තක්සේරුවකින් තොරව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශකරන ව්‍යාපාරික ගොඩනැගිලි හිමියෙකුට ගෙවනු ලබන දිමනාව | එක් ව්‍යාපාර හිමියෙකුට රු. 500,000/- කි. |
| | 11.2 | හානි තක්සේරුවකින් පසුව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශකරන ව්‍යාපාරික ගොඩනැගිලි හිමියෙකුට ගෙවනු ලබන දිමනාව | එක් ව්‍යාපාර හිමියෙකුට තක්සේරුගත වටිනාකම මත ගෙවනු ලබන උපරිම දීමනාව රු. 5,000,000/-කි |
| 12. | ආපදා බලපෑම හේතුවෙන් **පූර්ණ වශයෙන් හානි සිදුවී ඇති, නායයෑමේ අවදානම් තත්ත්වය හේතුවෙන් පදිංචි වීමට නොහැකි බවට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය මඟින් තහවුරු කර ඇති නිවාස** සඳහා නව නිවසක් ඉදි කර ගැනීමට ලබා දෙනු ලබන දීමනාව. | | පදිංචි නිවස සඳහා නිවාස හිමියෙකුට රු. 5,000,000/- ක් බැගින් |
| 14 | ආපදා බලපෑම හේතුවෙන් අර්ධ වශයෙන් හානි වූ නිවාස පිළිසකර කර ගැනීම සඳහා නිවාස හිමියෙකුට උපරිමය රු. 2,500,000/- ක් දක්වා ගෙවනු ලබන දීමනාව. | | |
| | 14.1 | හානි තක්සේරුවකින් තොරව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශකරන නිවාස හිමියෙකුට ගෙවනු ලබන දිමනාව | එක් නිවාස හිමියෙකුට රු. 500,000/- කි |
| | 14.2 | හානි තක්සේරුවකින් පසුව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශකරන නිවාස හිමියෙකුට ගෙවනු ලබන දිමනාව | එක් නිවාස හිමියෙකුට තක්සේරුගත වටිනාකම මත ගෙවනු ලබන උපරිම වන්දිය රු. 2,500,000/-කි |

03. ආපදා තත්ත්වය හේතුවෙන් හානියට පත් ආගමික ස්ථාන පිරිසිදු කර යථා තත්ත්වයට පත්කර ගැනීමට ලබාදෙන රු. 25,000/- ක එක් වරක් පමණක් ගෙවනු ලබන දීමනාව ආගමික කටයුතු සම්බන්ධ විෂය භාර දෙපාර්තමේන්තු විසින් ලබාදෙන නිර්දේශ අනුව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

04. මෙම සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අදාල රේඛීය අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු විසින් සුදුසු පරිදි අවශ්‍ය උපදෙස් නිකුත් කරනු ඇත.

05. අයවැය චක්‍රලේඛ අංක 08/2025 හි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

**ඒ. එන්. හපුගල**
භාණ්ඩාගාර ලේකම් (වැ.බ.)

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති